# ඒන්ජල් අතුරුදහන්

ලෝකයේ උසම දිය ඇල්ල වන ඒන්ජල් දිය ඇල්ල හදිසියේම අතුරුදහන්වීම ඉකුත් මාසයේ සිදුවූ, එතරම්ම ජනතා අවධානයට ලක්නොවූ සිදුවීමකි. 'ඒන්ජල්' වෙනුවට දැන් ලෝකයේ උසම දිය ඇල්ල බවට පත්ව ඇත්තේ 'කෙරෙපාකුපායි මෙරු' නම් දිය ඇල්ලයි. මේ විපර්යාසයට හේතුවී ඇත්තේ පෘථිවි ගෝලයේ සිදුවූ කිසියම් විශ්මිත වෙනස්කමක් යැයි ඔබ සිතන්නේද ? නැත. ඒ වෙනසට හේතුවූයේ ඇමරිකාව සම්බන්ධයෙන් ලෝකයේ බොහෝ රාජ්‍යයන් දක්වන විරෝධාකල්පයයි. අඩි 3280 ක් උස ලෝකයේ උසම දිය ඇල්ල වූ ඒන්ජල් දිය ඇල්ල පිහිටියේ වෙනිසියුලාවේය. එයට 'ඒන්ජල්' යන නම ලැබී තිබුණේ එය ලෝකයට හඳුන්වාදුන් ඇමරිකානු දේශ ගවේෂකයෙකු වන ජිම් ඒන්ජල් ට ගෞරව කිරීමක් වශයෙනි. මොහු ගමන්ගත් ගුවන්යානය මේ දියඇල්ල ආසන්නයට කඩාවැටීමෙන් දිවි බේරාගත් හෙතෙම පසුව දියඇල්ල පිළිබඳ ලොවට අනාවරණය කෙළේය.

## ඒන්ජල් අතුරුදහන්

ඇමරිකානු දේශගවේෂකයා පැමිනෙන්නට පෙර තම රට වැසියන් මේ දිය ඇල්ල පිළිබඳ දැන සිටි බව පවසමින් වෙනිසියුලා ජනාධිපති හියුගෝ චාවේස් 'ඒන්ජල්' යන නම වෙනුවට එයට 'කෙරෙපාකුපායි මෙරු' යන දේශීය නාමය තබන ලදි. මේ පසුගිය සති කිහිපය තුළ ඇමරිකාව කෙරෙහි ලෝකයේ සෙසු රටවල විරෝධය ප්‍රකාශ වූ එක් අවස්ථාවක් පමණි.

මීට වඩා උණුසුම් ආකාරයෙන් ඇමරිකානු



විරෝධය ප්‍රකාශයට පත්කෙරුණු අවස්ථා ගණනාවක් විවිධ රටවලින් වාර්තා විය. මාර්තු මස 21 දිනට යෙදී තිබූ ඇමරිකා ජනාධිපති බැරැක් ඔබාමාගේ ඉන්දුනීසියා සංචාරයට විරෝධය පළකරමින් එරට දැඩි මතධාරී මුස්ලිම් සංවිධානයක් වන 'හිස්බුත් තහීර්' සංවිධානය විසින් මාර්තු 14 දා ඉන්දුනීසියාවේ නගර ගණනාවක පැවැත්වූ විරෝධතා ඉන් එක් අවස්ථාවකි. බුෂ්ගේ වර්ණය නැතත් ඔබාමාට ඇත්තේද බුෂ්ගේ ප්‍රතිපත්ති බැවින් ඉස්ලාම් දහමට අනුව ජනපති ඔබාමා මුස්ලිම් ජාතිකයන්ගේ සතුරෙකු වශයෙන් සැළකිය යුතු බව එහිදී උද්ඝෝෂකයෝ ප්‍රකාශ කළහ. ඔබාමා 60 දශකයේ වසර කීපයක් ඉන්දුනීසියාවේ ජීවත්වූ අයෙකු වන බැවින් මේ විරෝධතාව ඔහුට වඩා සංවේදී එකක් වූවා නිසැකය.

කොරියානු අර්ධද්වීපයෙහි හදිසි තත්ත්වයක් ඇති වුවහොත් ඇමරිකානු හමුදාව ක්‍රියාත්මක විය යුතු ආකාරය සොයා බැලීමේ අරමුණින් ඇමරිකාව හා දකුණු කොරියාව දින 11ක ඒකාබද්ධ යුද අභ්‍යාසයක් ක්‍රියාත්මක කළ අතර මාර්තු 08 වන දින ආරම්භ කෙරුණු එම යුද අභ්‍යාසය සම්බන්ධයෙන් දැඩි විරෝධතාව ප්‍රකාශ කළ උතුරු කොරියාව සියළු හමුදා සීරුවෙන් තබා තිබිණි. යුද අභ්‍යාසයේදී යම් අවස්ථාවක සිය දේශසීමාව උල්ලංඝනය වුවහොත් බලවත් ප්‍රහාරයක් එල්ල කරන බවටද උතුරු කොරියාව අනතුරු අඟවා තිබුණි. කෙසේ වුවද ගුවන් ප්‍රහාර, නාගරික සටන් වැනි අභ්‍යාස ජීව උණ්ඩ යොදාගනිමින් සිදුකෙරුණු මෙම අභ්‍යාසය උතුරු කොරියාව හා ගැටුමක් ඇති නොවන ආකාරයෙන් අවසන් කිරීමට ඇමරිකාව සහ දකුණු කොරියාව සමත්විය. ලෝකයේ සෙසු රටවල් ඇමරිකානු විරෝධය මෙලෙස ප්‍රකාශයට පත්කරමින් සිටින අතර ඇමරිකානු ජනතාව තුළ ගොඩනැගෙමින් පවතින ඔබාමා විරෝධය ප්‍රකට කෙරෙන සිදුවීම් කිහිපයක් එරටින්ම වාර්තා වූයේද එම දිනවලදීමය. ඔබාමා ජනාධිපතිධූරයට පත්වීමෙන් පසු ඔහුට එරෙහිව ඇමරිකාවේ පැවති දැවැන්තම උද්ඝෝෂණ ව්‍යාපාරය මාර්තු 20 දා වොෂින්ටන්හි පිහිටි ධවල මන්දිරය ඉදිරිපිටදී පැවැත්විණි. ඇමරිකා හමුදා ඉරාකය ආක්‍රමණය කර හත්වැනි සංවත්සරය යෙදී තිබුණු මෙදින විරෝධතාවට සහභාගී වූවෝද ඔබාමා බුෂ්ගේ අඩි පාරේ ගමන් කරන්නෙකු බවට චෝදනා කළේය.
මෙම සිදුවීම ඊට දින කිහිපයකට ඉහතදී සමීක්ෂණ වාර්තාවක් මගින් ඔබාමා සම්බන්ධයෙන් හෙළිකරන ලද කරුණු සනාථ කරවන්නක් විය.

ඇමරිකාව තුළ ඔබාමාගේ ජනප්‍රියත්වය සීඝ්‍රයෙන් පහළ බසිමින් පවතින බව සමීක්ෂණ වාර්තාවක් මගින් ප්‍රකාශයට පත්කර තිබුණේ විරෝධතාවට තෙදිනකට කලිනි. ඒ අනුව එරට ජනතාවගෙන් 47% ක් ඔබාමාගේ ක්‍රියාකාරීත්වය අනුමත නොකරන බව පවසා තිබේ. අනුමත කර ඇති සංඛ්‍යාව 46% කි. 2009 ජනවාරි මාසයේ හෙතෙම බලයට පත්වීමෙන් පසු මුල්කාලයේ සිදුකරන ලද සමීක්ෂණයකදී ඔබාමාගේ ක්‍රියාකාරීත්වය අනුමත කරන ලද සංඛ්‍යාව 68% ක් ලෙස වාර්තා වී තිබිණ. වර්ෂයක් තුළ ඔබාමා වෙතින් ඇමරිකානුවන් කොතරම් දුරස්වීද යන්න ඒ අනුව පෙනීයයි. කෙසේ වුවද මේ සියළු ප්‍රතිවිරෝධතා අතරේ සෞඛ්‍ය රක්ෂණ පනත සම්මත කරගැනීමට ඔබාමා සමත්වීම ඔහු ලද ජයග්‍රහණයක් සේ සැළකිය හැකිය. මෙම පනත පිළිබඳ අදහස ඉදිරිපත්වීමත් සමඟ එය උණුසුම් මාතෘකාවක් බවට පත්වූ නමුත් මාර්තු 21 දා පැවති විවාදයෙන් අනතුරුව පනත සම්මත කරගැනුණේ එකම රිපබ්ලිකන් පාක්ෂිකයෙකුගේ හෝ ඡන්දයෙන් තොරව වීම කැපී පෙනුණි.

## කෝපයේ දිනය

ඇමරිකානු ජනාධිපතිවරයාට මෙන්ම රුසියානු අගමැතිවරයාටද මාර්තු 20 එතරම් සුභදායක දිනයක් නොවීය. දෙදනාටම සිය රටවැසියන්ගේ විරෝධතාවයන්ට මුහුණ දෙන්නට සිදුවී තිබුණේ එදිනය. රුසියානු අගමැති ව්ලැඩිමීර් පුටින්ගේ පාලනයට එරෙහිව මොස්කව් අගනුවර ඇතුළු ප්‍රධාන නගර ගණනාවක මාර්තු 20 දා ජනතා උද්ඝෝෂණ පැවැත්විණි. විපක්ෂ කණ්ඩායම් එදින කෝපයේ දිනය වශයෙන් නම් කර තිබූ අතර ජනතාවට සහන සැළසීමට අපොහොසත්වීමත් ජනතා අයිතීන් ආරක්ෂා කිරීමට අසමත් වීමත් අගමැතිවරයාට එරෙහිව එල්ල කෙරුණු චෝදනා විය. ලෝකයේ බලවත් රටවල නායකයන් මුහුණ දී සිටින තත්ත්වයන්

***<u>අගමැති පුටින් ඉන්දීය ජනාධිපතිනි ප්‍රතිභා පටේල් ද හමුවීමෙන් අනතුරුව අස්සන් කෙරුණු ගිවිසුම්වල වටිනාකම ඩොලර් බිලියන දහයක් පමණ වන බව වාර්තාවේ.</u>***

'ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ' යන ගැමි පිරුළ සිහිපත් කරවන සුළුය. රුසියානු අගමැතිවරයා මේ විරෝධතාවන්ට මුහුණ දුන්නේ ඉන්දීය සංචාරය නිමවා සිය රට පැමිණ සතියක් ඉකුත්ව යන්නටත් පෙරය.

මාර්තු 12 දා රුසියාවේ පැරණි මිතුරෙකු වන ඉන්දියාවට ගිය අගමැති පුටින් දෙරට අතර යුද්ධෝපකරණ ගිවිසුම් කිහිපයක්ම අස්සන් තැබුවේය. අගමැති පුටින් ඉන්දීය ජනාධිපතිනි ප්‍රතිභා පටේල් ද හමුවීමෙන් අනතුරුව අස්සන් කෙරුණු ගිවිසුම්වල වටිනාකම ඩොලර් බිලියන දහයක් පමණ වන බව වාර්තාවේ. මේ යටතේ මිග් ප්‍රහාරක යානා 22 ක් ඇතුළුව තවත් යුද අවි ඉන්දියාවට ලබාදීමට රුසියාව එකඟවී තිබේ.

## "ද හර්ට් ලොකර්"

ලෝක ප්‍රජාවගේ අවධානය නැවතත් ඉරාකය දෙසට යොමුකෙරුණු සිදුවීම් දෙකක් ඉකුත් මාසයේ ඇමරිකාවෙන් සහ ඉරාකයෙන් වාර්තාවිය. ඇමරිකානු සිදුවීම වාර්තා වූයේ හොලිවුඩ් පුරයෙනි. 82 වැනි ඔස්කාර් සිනමා




සම්මාන උළෙල මාර්තු 07 දා හොලිවුඩ් පුරයේ කොඩැක් රංග ශාලාවේදී පැවැත්වුණු අතර එහි හොඳම අධ්‍යක්ෂණය වෙනුවෙන් පිදෙන සම්මානය ප්‍රථම වරට කාන්තාවක විසින් හිමිකර ගත්තාය. කැතරින් බිගලොව් නමැති 58 වියැති මේ කාන්තාවට එම සම්මානය හිමි වූයේ ඉරාක යුද්ධය පසුබිම් කරගෙන නිර්මාණය කරන ලද 'ද හර්ට් ලොකර්' චිත්‍රපටය අධ්‍යක්ෂණය වෙනුවෙනි. හොඳම අධ්‍යක්ෂණය ඇතුළුව තවත් සම්මාන හයක් දිනාගන්නට සමත් වූ හර්ට් ලොකර් චිත්‍රපටය රූපගත කරනු ලැබ තිබුණේ ඉරාක දේශසීමාව ආසන්නයේ ජෝර්දානයේය. ඉරාකයේ පශ්චාත් යුද සමයේ බිම්බෝම්බ ඉවත් කිරීමේ මෙහෙයුමක් පාදක කරගෙන චිත්‍රපටිය නිර්මාණය කරනු ලැබ තිබිණ

අනෙක් සිදුවීම වූයේ ඉරාක මහ මැතිවරණයයි. මෙය ලියන මොහොත වන විට මැතිවරණයේ ප්‍රතිපළවලින් 95% ක් පමණ ප්‍රකාශයට පත්කර අවසන්ය. ඒ අනුව හිටපු අගමැති ඉරාඩ් අලාවියාගේ 'ඉරාකියා' පක්ෂය ඉදිරියෙන් සිටින අතර ඡන්ද නැවත ගනන් කළ යුතු බවට වන ප්‍රභල මතවාදයක් රට තුළ ව්‍යාප්ත වෙමින් පවතියි.

## බැග්ඩෑඩ් අගනුවරට රොකට්

ඇමරිකාව ප්‍රමුඛ බටහිර හමුදා ආක්‍රමණයෙන් සදාම් හුසේන්ගේ පාලනය අවසන් කිරීමෙන් පසු පැවැත්වූ ඉරාකයේ දෙවැනි මහ මැතිවරණය අවසන්වූයේ මාර්තු හත්වෙනිදාය. 4, 5 සහ 6 තෙදින රෝගී වූවන්ට සහ සිරකරුවන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වෙන්කරනු ලැබ තිබුණු අතර එම දිනවලදී ද ඡන්ද මධ්‍යස්ථාන ඉලක්ක කර ගනිමින් ත්‍රස්තවාදී ප්‍රහාර ගණනාවක් එල්ල කෙරිණ. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරද ඇතුළත් එම ප්‍රහාර හේතුවෙන් 12කට නොඅඩු පිරිසක් ජීවිතක්ෂයට පත්වී තවත් පිරිසක් තුවාල ලැබූහ.

දැඩි ආරක්ෂක රැකවල් මධ්‍යයේ පැවැත්වුණ මැතිවරණයේදී බැග්ඩෑඩ් අගනුවර ආරක්ෂාව සඳහා පමණක් පොලිස් නිලධාරීන් ලක්ෂ දෙකක් පමණ යොදවා තිබිණ. එහෙත් ඡන්දය ප්‍රකාශ කිරීම ඇරඹෙනවාත සමඟම ඉරාක අගනුවර ප්‍රභූ නිවාස පිහිටි විශේෂ ආරක්ෂක කලාපයට ද මෝටාර් ප්‍රහාර එල්ල වන්නට පටන් ගත්තේය. අල්-ක්වයිදා ප්‍රමුඛ මුස්ලිම් සටන්කාමීන් විසින් සිදුකරනු ලැබූ එම ප්‍රහාර හේතුවෙන් මැතිවරණය අවසන් වන විට 38 දෙනෙකු ජීවිතක්ෂයට පත්වී 110 ක් පමණ තුවාල ලබා තිබිණ. ප්‍රහාර වලින් බරපතල හානි සිදුව තිබුණේ බැග්ඩෑඩ් හි සුන්නි ප්‍රදේශ වලටය. එම ප්‍රදේශයට එල්ල වී තිබුණු රොකට් ප්‍රහාර සංඛ්‍යාව 70 ක් පමණ වන අතර ප්‍රහාර වලට ලක්වීමෙන් නේවාසික ගොඩනැගිල්ලක් විනාශ වීමෙන් මියගිය සංඛ්‍යාව 25 ක් බව වාර්තා විය.

## අම්මාට ආයුබෝවන්

'චිලියේ අම්මා' ලෙසින් විරුදාවලි ලත් ජනාධිපතිනී මිචෙල් බැචලේගේ ධූර කාලය අවසන් වීමෙන් පසු චිලි රාජ්‍යයේ නව අගමැති වශයෙන් සෙබස්තියන් පිනේරා මාර්තු 11 දා දිවුරුම් දුන්නේය. මිචෙල් වාමාංශික වන අතර පිනේරා දක්ෂිණාංශික දේශපාලකයෙකි. ලෝකයේ ධනවත්ම පුද්ගලයන් අතර 437 වැනියා ලෙසින් සැළකෙන හැට හැවිරිදි පිනේරා දිවුරුම් දී හෝරා කිපියකට පසු රිච්ටර් මාපකයේ 6.9 ක් සටහන් කෙරුණු භූමිකම්පාවකින් නැවතත් චිලිය දෙදරා ගියේය. පෙබරවාරි 27 දා භූමිකම්පාවෙන් සිදුවූ විනාශයෙන් පසු අවස්ථා ගණනාවක් නැවත නැවතත් ඇතිවූ භූමි කම්පා හේතුවෙන් චිලි රාජ්‍යයට සිදුවූ විනාශය අති මහත්ය.

චිලියේ භූමිකම්පාව හේතුවෙන් පෘතුවි අක්ෂයේ සිදුවූ වෙනස්වීමක් නිසා පෘතුවියේ පැය 24 ක දිනක කාලය තත්පර 1.26 කින් අඩුවී ඇති බව මේ අතර නාසා ආයතනයේ විද්‍යාඥයෙකු වන රිචර්ට් ග්‍රාස් ප්‍රකාශ කර තිබිණ. චිලියේ අම්මා අගමැති ධූරයට ආයුබෝවන් කියද්දී නේපාලයේ හිටපු අගමැති ගිරිරාජ් ප්‍රසාද් කොයිරාල මාර්තු 20 දා ලෝකයටම ආයුබෝවන් කියා ජීවිතයෙන් සමුගත්තේය. නේපාලයේ පැවැති මාවෝවාදී කැරලිකරුවන්ගේ යුද්ධය නිමා කර රටට සාමය ගෙනා හෙතෙම මියයන විට අසූවැනි වියෙහි පසුවිය.
බ්‍රිතාන්‍ය දේශපාලනය මහත් කැළඹීමකට පත්කළ සිදුවීමක් වාර්තා වූයේ මාර්තු 21 වන දිනය. එරට ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතන දෙකක් විසින් අගමැති ගෝඩන් බ්‍රවුන්ගේ කම්කරු පක්ෂයේ




ශ්‍රීලාල් සෙනෙවිරත්න

ඇමැතිවරුන් තිදෙනෙක් විවිධ කටයුතු ඉටුකර දීම සඳහා ජනතාවගෙන් අල්ලස් ගන්නා ආකාරය වීඩියෝ ගත කර මාධ්‍ය ඔස්සේ ප්‍රකාශයට පත්කිරීම එම සිදුවීමය. 'චැනල් 4' රූපවාහිනී සේවය සහ 'ද සන්ඩේ ටයිම්ස්' පුවත්පතේ මාධ්‍යවේදීන් වෙස්වලාගෙන එම සිදුවීම් රූපගත කර තිබුණි. අගමැති බ්‍රවුන් විසින් ඇමැතිවරුන්ගේ සේවය අත්හිටුවා සිදුවීම් පිළිබඳ පුළුල් පරීක්ෂණයක් ආරම්භ කළද මැයි මස 6 දා මහ මැතිවරණය පැවැත්වීමට නියමිතව තිබියදී සිදුවූ මේ අනාවරණයෙන් පසු කම්කරු පක්ෂයට විශාල අවාසියක් සිදුවනු ඇති බව දේශපාලන විශ්ලේෂකයෝ පවසති.

නයිජීරියාවේ ප්ලාටෙයු ප්‍රාන්තයේ අගනුවර වන ජෝස් සහ ඒ ආසන්නයේ පිහිටි ගම්මාන තුනකට මාර්තු හත්වන ඉරිදා පෙරයම කඩා වැදුණු අවිගත් ප්‍රහාරකයන් කණ්ඩායමක් එල්ල කළ ප්‍රහාරයකින් අවම වශයෙන් 300 දෙනෙකු ජීවිතක්ෂයට පත්වූහ. ඇතැම් වාර්තා අනුව මියගිය සංඛ්‍යාව එමෙන් දෙගුණයකි. ජිහාඩ් අන්තවාදී ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද මේ ප්‍රහාරයෙන් ජීවිතක්ෂයට පත් වැඩි පිරිස කාන්තාවන්. කුඩා දරුවන් සහ මහල්ලන් වන අතර ඔවුහු නයිජීරියාවේ පමණක් ජීවත්වන ගොවිතැන සිය ජීවිකා වෘත්තිය බවට පත්කර ගත් කුඩා ජන කණ්ඩායමක් වන බේරොම් ගෝත්‍රයට අයත්වූවෝ වෙති. එය මාර්තු මාසයේ අසන්නට ලැබුණු කෲරතම සිදුවීමකි.